# COVID-19 සහ ෆ්ලූ හේතුවෙන් දරුණු ලෙස රෝගාතුරවීමේ වැඩි අවදානමක් ඔබට ඇතිනම් කල් තියා සැලසුම් කරන්න

## COVID-19 සහ ෆ්ලූ හේතුවෙන් දරුණු ලෙස රෝගාතුරවීමේ වැඩි අවදානමක් ඔබට ඇතිද?

### මේ අය අතර පහත අය සිටී:

- වයස අවුරුදු 60 සහ ඊට වැඩි අය
- ගර්භනී කාන්තාවන්
- ඇබොරිජිනල්, ටෝරස් ස්ට්‍රේට් සහ පැසිෆික් දූපත්වාසීන්
- සට්ලතාවය, දියවැඩියාව, දරුණු හෘද වාහිණී රෝග, නිදන්ගත පෙනහළු රෝග (පසුගිය මාස 12 ඇතුලත දරුණු ඇදුම හේතුවෙන් රෝහල්ගතවූ අය ඇතුළුව) දරුණු නිදන්ගත අක්මා හෝ වකුගඩු රෝග, සක්‍රීය පිළිකා හෝ දුර්වලවූ ප්‍රතිශක්තිකරණය ඇති අය
- සිය පෙනහළු, හෘදය වස්තුව හෝ ප්‍රතිශක්තිකරණ පද්ධතියට බලපෑම් ඇතිව ආබාධිතවූ අය ඇතුළුව සමහර ආබාධිත අය
- වැඩිහිටි රැකවරණ සහ ආබාධිත රැකවරණ පහසුකම්වල සිටින නේවාසිකයන්
- එන්නත් ලබා නොගත් වයස අවුරුදු 18 සහ ඊට වැඩි අය

ඔබ රෝගාතුර වුවහොත්, ඔබව සුවවීම සඳහා ඔබගේ වෛද්‍යවරයා විසින් ඔබට ඇන්ටිවයිරල් බෙහෙත් නිර්දේශ කල හැකිය.

ඔබ අසනීපවූ විගස ඔබ විසින් මෙම බෙහෙත් ලබා ගැනීම අවශ්‍යවේ.

ඔබට ඇන්ටිවයිරල් සුදුසුද යන්න දැන ගැනීම සඳහා දැන්ම ඔබගේ වෛද්‍යවරයා සමඟ කථා කර කලින්ම සැලසුම් කර ගන්න.

ඔබගේ සෞඛ්‍යය සම්බන්ධව කිසියම් ගැටළුවක් ඇති අතර භාෂා උපකාර අවශ්‍ය නම්, දුරකථන අංක **131 450** ඔස්සේ TIS අමතා Home Support Line දුරකථන අංක **1800 960 933** ඔස්සේ NSW Health Flu සහ COVID-19 Care ඉල්ලා සිටින්න.

**වැඩිදුර විස්තර සඳහා www.nsw.gov.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.**


© NSW Health May 2022.